ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

# මාධ්‍ය නිවේදනය

මහජන කටයුතු අංශය
දුරකථන: +94 (1) 249-8100 ● ෆැක්ස් : +94 (1) 244-9070
විද්‍යුත් තැපෑල : VanHornNT@state.gov ● http://lk.usembassy.gov

නිවේදන අංකය. 20180322

**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය සහ මාතර වාණිජ මණ්ඩලය එක්ව ඇමෙරිකානු නව නිර්මාණ කවය (American Innovation Hub) දියත් කරයි.**

**2018 මාර්තු මස 22 වන දින :** ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය මාතර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලය සමග එක්ව 2018 මාර්තු 21 වන දින ඇමෙරිකානු නව නිර්මාණ කවය (iHub) දියත් කරන ලදී. මෙම කවයේ iHub හි අරමුණ වන්නේ තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථා ජනනය කිරීම, ඉංග්‍රීසි භාෂා ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම, ඇමෙරිකා එක්සත් ජනපදය තුළ අධ්‍යාපනය ලැබීමට දිරිගැන්වීම සහ එවන් අධ්‍යාපන අවස්ථා පැහැදිලි කිරීම හා අන්තර් පුද්ගල සබඳතා ශක්තිමත් කිරීම ආදියයි. iHub මධ්‍යස්ථානය සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වාත් සෙනසුරාදා දින පෙ.ව. 9.00 සිට මධ්‍යහ්න 12.00 දක්වාත් විවෘත පවතින අතර iHub විසින් පවත්වන සියළු තේමාපාදක වැඩසටහන් සහ තෝරාගත් ඇ.එ.ජ. පොත් සහ DVD නොමිලේ සැපයේ.

මාතර හක්මන පාරේ අංක 149 දරණ ස්ථානයේ පිහිටා ඇති මාතර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩල ගොඩනැගිල්ලේ ඇති iHub මධ්‍යස්ථානය ඇ.එ.ජ. තානාපති කාර්යාලයේ මහජන සබඳතා නිලධාරී ජේම්ස් රූසෝ මහතා සහ මාතර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සභාපති මෙත්තා විදානගමගේ මහතා විසින් විවෘත කරන ලදී.

සමාරම්භක අවස්ථාවට සහභාගි වූ ජේම්ස් රූසෝ මහතා පැවසුවේ තාක්ෂණික හා ඉංජිනේරු වැඩසටහන් හරහා iHub විසින් දකුණු පළාතේ තරුණ තරුණියන්ගේ නිර්මාණශීලීත්වය සහ ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු වනු ඇති බවයි. 'ශ්‍රී ලංකාව සමග අපගේ හවුල්කාරිත්වයේ 70 වන වසර සමරන මෙම වසරේදී අපගේ අන්තර් පුද්ගල සබඳතාවයන් මාතර තෙක් පුළුල් කිරීමට හැකි වීම පිළිබඳව බෙහෙවින් සතුටට පත්වන' බව හෙතෙම තවදුරටත් පැවසීය.

මාතර ඇරඹි iHub මධ්‍යසථානයට අමතරව කොළඹ, මහනුවර, යාපනය සහ මාලේ යන නගර වලද ඇමෙරිකානු සම්පත් මධ්‍යස්ථාන ස්ථාපිත කොට ඇත. ඒ හරහා පොත්පත්, ඩීවීඩී, ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන්, ව්‍යවසායකත්ව වැඩසටහන්, ඇමෙරිකානු කථිකයින් සහ තවත් සේවා රැසක් ශ්‍රී ලාංකිකයින් හට ලබා දේ. වැඩිදුර විස්තර සඳහා ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ 'ඇමරිකන් ස්පේසස්' හි වෙබ් අඩවියට පිවිසෙන්න.
https://lk.usembassy.gov/education-culture/american-spaces/